# ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය

## වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

# පුරප්පාඩු

අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය පහත දක්වා ඇති තනතුර සඳහා ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය යනු පරීක්ෂණ/ ක්‍රමාංකන විද්‍යාගාර, වෛද්‍ය රසායනාගාර, පරීක්ෂණ ආයතන සහ අනුකූලතා තක්සේරු කිරීම්වලට සම්බන්ධ සහතික කිරීමේ ආයතන ප්‍රතීතනය කිරීම සඳහා වගකියනු ලබන, 2005 අංක 32 දරන පනත යටතේ පිහිටුවා ඇති ශ්‍රී ලංකාව සඳහා වන ජාතික ප්‍රතීතන අධිකාරියයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය වර්තමානයේදී වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වෙයි. ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය විසින් සිදු කරනු ලබන ප්‍රතීතන වැඩසටහන් සඳහා IAF MLA සහ ILAC MRA විසින් පිළිගැනීමට ලක්ව ඇත.

## සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රතීතන)

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

01. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යාව/ වෛද්‍ය රසායනාගාර විද්‍යා/ ඉංජිනේරු මූලික උපාධියක් ලබා තිබීම.

**සහ**

මූලික උපාධිය ලැබීමෙන් පසුව, රාජ්‍ය සේවයේ, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක ප්‍රතීතනය, අනුකූලතා ඇගයීම, පද්ධති විගණනය සහ අදාළ කටයුතු සම්බන්ධව අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්ද ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2) :**

1. ඉහත සඳහන් කළ බාහිර අයදුම්කරුවන් විසින් සැපිරිය යුතු සුදුසුකම් ලබා තිබීම.
2. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය තුළ කණිෂ්ඨ කළමනාකරු (JM1-1) කාණ්ඩයේ තනතුරක අවම වශයෙන් වසර පහක් (5) සම්පූර්ණ කර තිබීම.

**වැටුප් කේතය සහ මාසික වැටුප් පරිමාණය : MM 1-1 – 2016 - රු. 53,175 – 10 x 1,375– 15 x 1,910 = 95,575/-**

**බඳවා ගැනීමේදී ඔබව රු. 53,175/- ක් වන වැටුප් තලයේ පිහිටුවනු ඇත.**

**වයස :**

අපේක්ෂකයන් අවුරුදු 22 ට නොඅඩු අවුරුදු 45 ට නොවැඩි විය යුතුය අභ්‍යන්තර අපේක්ෂකයන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**ස්ථිර කිරීම :**

මෙම කාණ්ඩයේ II ශ්‍රේණියට පත්වීම් ලබන බාහිර අපේක්ෂකයකු, රාජකාරි භාරගැනීමේ සිට වසර තුනක පරිවාස කාලයකට යටත් වේ. පරිවාස කාලය තුළ ඔහුගේ/ ඇයගේ කාර්ය සාධනය සතුටුදායක නම් සහ 1 වන කාර්යක්ෂමතා කඩ ඉම් විභාගය සමත් වීමෙන් පසුව, පරිවාස කාලය අවසානයේදී ඔහු/ ඇය තනතුරේ ස්ථිර කෙරෙනු ලැබේ. දැනටමත් තනතුරේ ස්ථිර කර ඇති අභ්‍යන්තර සේවකයන් වසර එකක වැඩ බැලීමේ කාලයකට යටත් වෙනු ඇත.

**බඳවාගැනීමේ පටිපාටිය :**

ලිඛිත විභාගයක් සහ/හෝ ව්‍යුහාත්මක සම්මුඛ පරීක්ෂණය තුළින්

**වෙනත්**

රජය විසින් අනුමත දීමනාවන් ගෙවනු ලැබේ. සේ.අ.අ වෙත 15% සහ සේවා.නි.භා.අ වෙත 3% ක දායකත්වයක් ලබා දෙනු ලැබේ. එමෙන්ම වෛද්‍ය රක්ෂණය සඳහා හිමිකම් ලැබේ.

**සෑම අයදුම්කරුවෙකුම**

අ. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ආ. තනතුරේ රාජකාරි ඉටු කිරීමට මනා ශාරීරිකව හා සෞඛ්‍ය සම්පන්න විය යුතු අතර, රටේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමැත්තෙන් සිටිය යුතුය.

ඇ. විශිෂ්ඨත්වයෙන් හෙබි සදාචාර සම්පන්න පුද්ගලයෙකු විය යුතුය.

**අයදුම් කළ යුතු ආකාරය**

සෑම අපේක්ෂකයෙකුම අපගේ නිල වෙබ් අඩවිය වන **www.slab.lk** (https://www.slab.lk/career/) තුළින් අයදුම්පත්‍ර සම්පූර්ණ කළ යුතු අතර, මාර්ගගතව අයදුම් කිරීමෙන් පසුව නිසි ලෙස සම්පූර්ණ කර බාගත් අයදුම්පත්‍ර **2023 මැයි 10** වන දින හෝ එයට පෙර අදාළ සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට එවිය යුතු ය. අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සටහන් කළ යුතු ය. අයදුම් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා මාර්ග ගත ක්‍රමයට අයදුම්පත පිරවීම හා එම අයදුම් පත අදාල ලියවිලි සහිතව ලියාපදිංචි තැපෑලෙන් එවීම අනිවාර්ය වේ.

**සභාපති,**

**අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලය**

**අංක 104/ඒ, කිතුල්වත්ත පාර, බොරැල්ල.**